ඇමුණුම - 2

# සමස්ත ලංකා සිගරට් දුම් උදුන් හිමි සංගමය
## All Ceylon Cigarette Tobacco Barn Owner's Association

2017.08.09

ගරු අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමා,

අග්‍රාමාත්‍ය කාර්යාලයය, අංක 58,

ශ්‍රීමත් අර්න්ට් ද සිල්වා මාවත,

කොළඹ 07.

මහත්මයානෙණි,

<u>දුම්කොළ වගාවට උද්ගතවී ඇති ගැටළු නිරාකරණය කිරීම සඳහා මැදිහත්වන ලෙස කරනු ලබන ඉල්ලීමයි</u>

ඉහත මාතෘකාවට අදාලව පහත කරුණු ඔබ තුමාගේ කාරුණික අවධානයට යොමු කරනු කැමැත්තෙමු.

1 - දුම්කොළ වගාව ආර්ථික බෝගයක් ලෙස රජයේ පූර්ණ මැදිහත් වීමෙන් හඳුන්වාදෙන ලද වගාවකි. (ඇමුණුම 01 - 1956 ලංකා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛණ අංක 32)

2 - රාජ්‍ය අනුග්‍රහය මත හඳුන්වාදෙන ලද මෙම බෝගය ජලය හිග කුඹුරු ඉඩම් ඇතුළු ආන්තික වගා භූමි සඳහා විකල්පයක් ලෙස රජය විසින් පිලිගනු ලැබ ඇත. (ඇමුණුම 02 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වී වගාව සඳහා පොහොර නිර්දේශය 1998. පිටු අංක 15 හා 18)

3 - ගොවීන් ආර්ථික බෝගයක් ලෙස දුම්කොල තෝරාගැනීමට හේතු වී ඇති කරුණු සඳහන් කරමින් අතිගරු ජනාධිපතිතුමා ඇතුළු දේශපාලන අධිකාරියට ද, කෘෂිකර්ම අමාත්‍යාංශය ඇතුළු රාජ්‍යය ආයතනවලටද වරින් වර කරුණු පැහැදිලි කර ඇත. (ඇමුණුම 03 - අතිගරු ජනාධිපති තුමාට යොමු කරන ලද ලිපි පිටපත්)

4 - 2020 දී දුම්කොල වගාව අවම කිරීමේ පදනමින් ඇරඹි සාකච්ඡා වලදී මෙන්ම අනෙකුත් සියලු සාකච්ඡා වලදී ද අවධාරණය කරන ලද ආකාරයට මෙම වගාවේ දී අප ලබන ප්‍රතිලාභ හා සමාන ප්‍රතිලාභ ලැබෙන වගාවක් හඳුනාගැනීමට අද වන තෙක් හැකිවී නැත.(ඇමුණුම 04 - ප්‍රතිලාභ සඳහන් පත්‍රිකාව)

5 - දුම්කොල වගාවෙන් අප ඉවත් කරන්නේ නම් ඒ සඳහා විකල්ප හා ගැලපෙන හානි පූර්ණ ලබා දිය යුතු බව පැවති සියලු සාකච්ඡා වලදී අප අවධාරණය කර ඇත. ඒ සඳහා ගැලපෙන විකල්ප හඳුනාගැනීම සඳහා 2017 දී ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ නියමු ව්‍යාපෘතියද මේ වනවිට අකර්මණ්‍ය ව ඇත.

6 - මේ කරුණු හේතුවෙන් ඇතිවී ඇති තත්ත්වය කන්න රැස්වීම් වලදී පැහැදිලි කර සුදුසු ක්‍රියා මාර්ග සඳහා යොමු වීමට අවස්ථාව ලබා දෙන ලෙස අප සංගමය විසින් 2017-01-30 දින කෘෂිකර්ම අමාත්‍යංශයෙන් ඉල්ලා ඇත.(ඇමුණුම 05 - අදාල ලිපියේ පිටපත). ඒ පිළිබඳව නිසි කටයුතු සිදුකරන ලෙස අමාත්‍යංශය අදාල අංශ දැනුවත් කර ඇති බව දැනගන්නට ඇතත්, දුම්කොළ වගා බල ප්‍රදේශ වල අදාල නිළධාරීන් අපව කන්න රැස්වීම් වලට අප සම්බන්ධ කර නොගැනීම හේතුවෙන් ගැටළුකාරී තත්ත්වයක් ඇතිවී ඇත.

7 - 2020 දී දුම්කොළ වගාව සීමා කිරීමේ රජයේ වැඩපිළිවෙල යටතේ මේ දක්වා සාකච්ඡා කර එකඟ වූ කරුණු පිළිබඳ රාජ්‍යය තන්ත්‍රණයේ ප්‍රාදේශීය මට්ටමේ නිළධාරීන් දැනුවත් නොවීම මත 2017 යල කන්නය සඳහා ප්‍රාදේශීය ලේකම්, ගොවිජන සංවර්ධන නිළධාරි, මහවැලි කොට්ඨාශ කළමණාකාර, වාරිමාර්ග ඉංජිනේරු,

කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර යන නිළධාරින්ගෙන් විවිධ බධා හා බලපෑම් එල්ලවී ඇත. (දුම්කොළ තහනම් වගාවක් ලෙස හඳුන්වා පැල උදුරා දමන ලෙස එවන ලද නිවේදනයක් මේ සමග අමුණා ඇත.)

එබැවින් 2020 දුම්කොළ වගාව අවම කිරීමේ රාජ්‍ය දිශානතිය සාවද්‍යය ලෙස අර්ථකතනය කරමින් ප්‍රාදේශීය මට්ටමේ ඇතැම් නිලධාරීන් සිදු කරන බලපෑම් නතර කිරීම සඳහා දුම්කොල වගාව තහනම් වගාවක් නොවන බවත්, විකල්ප වගාවන් සහ සාධාරණ හානි පූර්ණයක් ලබා දීමට නිසි වැඩ පිලිවෙලක් ක්‍රියාත්මක කර ගොවීන් ඉන් මුදවන තෙක් ඔවුන් සිය ජීවන වෘත්තියේ නියැලිය යුතු බවත්, මෙතෙක් පැවති සාකච්ඡා වලදී රජය මෙය ප්‍රතිපත්තියක් ලෙස පිළිගෙන ඇති බවත් අවධාරනය කරමින් අදාල අංශ සියල්ල ලිඛිතව දැනුවත් කරන මෙන් 300,000 කට අධික යැපෙන්නන් පිරිසක් නියෝජනය කරන සංගමයක් ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

මෙයට,

විශ්වාසී,

ජේ.ඒ.එගොඩවෙලේ

සමස්ත ලංකා සිගරට් දුම් උදුන් හිමි සංගමය

ජේ. ඒ. එගොඩවෙලේ
ගරු සභාපති
සමස්ත ලංකා සිගරට් දුම් උදුන් හිමි සංගමය
මැදිවක - [illegible].

071 8230799
076 7230799